## පුරප්පාඩු තනතුරු සඳහා විශ්‍රාමික නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම
## ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ. III ශ්‍රේණිය) - තනතුරු සංඛ්‍යාව 04**

**01. කොන්ත්‍රාත් කාලය :**

බඳවාගනු ලබන දින සිට එක් වසරක කාලයක් සඳහා හෝ මෙම තනතුරට ස්ථිර නිලධාරියෙකු පත්කරන තෙක්, මෙයින් පළමුව එළඹෙන දිනය දක්වා මෙම පත්වීම ක්‍රියාත්මක වේ.

**02. සලකා බලනු ලබන සුදුසුකම්**

I. යහපත් චරිතයකින් හා මනා ශාරීරික, මානසික සෞඛ්‍යයෙන් යුතු අයෙකු විය යුතු අතර, තනතුරේ රාජකාරි ඉටුකිරීමට හැකි ශාරීරික යෝග්‍යතාවයකින් යුතු අයෙකු විය යුතුය.

II. නිලධාරියා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය යටතේ විධිමත් පරිදි විශ්‍රාම ගන්වා තිබිය යුතුය.

III. අදාල නිලධාරියා විනය හේතුවක්, අකාර්යක්ෂමතාවයක්, අසතුටුදායක සේවාවක් වැනි හේතුවක් මත සේවයෙන් විශ්‍රාම ගන්වා නොතිබිය යුතුය.

IV. අදාල නිලධාරියාගේ විශ්‍රාම ගැනීමට පෙර සේවා කාලය සතුටුදායක බව හා විනය දඬුවම් ලබා නොමැති බව.

**03. වයස :-** අයදුම්කරුගේ වයස අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

**04.** වැටුප **:-** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි සඳහන් විධිවිධාන පරිදි හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි සඳහන් පරිදි මාසික පාරිතෝෂිකය ගෙවනු ලැබේ. එයට අමතරව මූලික වැටුපෙන් 25%ක අමතර දීමනාවක්ද ගෙවනු ලැබේ.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :-**

ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාලව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව මෙම තනතුර සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**06. අයදුම් කිරීමේ ක්‍රමය**

I. සලකා බලනු ලබන සුදුසුකම් සමගින් අයදුම්කරුගේ තොරතුරු ඇතුළත් කර සකස් කරන ලද ජීව දත්ත වාර්තාවක් තමන් විසින්ම සකසා 2026.10.23 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි **ලේකම්, ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 09 ගොඩනැගිල්ල, BMICH පරිශ්‍රය, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

II. අයදුම්පත් එවනු ලබන ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ **"විශ්‍රාමික නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් හා අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි,

තනුජා එන්. ප්‍රනාන්දු
ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
අංක 09 ගොඩනැගිල්ල,
BMICH පරිශ්‍රය,
කොළඹ 07.